## 49

# මා කළණ මිතුරු!

*ජයසිරි පෙරේරා*

පැණ තිලක වන් බුහුටි හෙළ බසට සමතා න
නැණ තිලක වන් කැලණි සරසවියෙ වියතා න
පිය තිලක වන් මසිත මතකයෙහි සඳපා න
කුල තිලක කුමරසිහ මහ ඇදුරු මහතා ණ

පුරා පන් විසි වසක මතකය අවදි කළ මුදු නිසල රැය කී
සරා මහ මග වෙහෙස වූ මට ඔබේ නිවහන ගිමන් සළ කී
තිරා මිස සෙනෙහසේ මල්පිපි ඔබේ හදවත නිසළ විල කී
පුරා සඳ නැගි මගේ අහසට ඔබෙ වදන් තරු පහන් පෙළ කී!

පියාඹා නොව ඇවිද ආවෙමි මෙතෙක් වූ ජීවන ගමන් මග
වියා ගත්තෙමි දිවි කළාලය සදා නොලිහෙන ලෙසින් මුළ අග
ලියා දන්වමි කුමන හෝ වරදක් නිසාවෙන් වියමනේ රඟ!
වියාගත් ඒ දිවි කළාලය තැනින් තැන කඩතොළුව ගිය වග!

"එදා"යා යුතු ගමන වැරදුනි අහේතුව කොතැනකද නොදනිමි
යොදා ගත සිත වෙනත් මඟකින් යළි අලුත් මාවතක ඇදුනෙමි
බදාගෙන තුන් හතර පළ "ඉංග්‍රීසි ටියුෂන්" පන්ති කරනෙමි
මෙදා එමගින් "යමක්" ලබනෙමි සිසුන්ටත් යහපතක් සළසමි!

සිතින්, මුදලින්, ඇඳුම්, අහරින් උදව් කළ මා කළණ මිතුරු
නිතින් කරුණා මවෙත හෙළුවේ සබඳ ඔබ හැර වෙනත් කවුරු
බැතින් සමරමි පියඹ දරු කැළ සුසිත් ගුණදම් සපිරි මහරු
ඉතින් සමුගන්නෙමි දයාමින! මිනිස් ගුණ පාරමී සපිරු!

## 50

# නැණඹර පුන්සඳ!

*නන්දසේන පලිහක්කාර*

පරතෙර දැන හැඳින සිප්සත ඉහළ ඉමේ
නැණඹර පුන් සඳුව දිදුලන දිනුව බිමේ
මහමෙර සදිසි මාතොට - නාවිමන ගමේ
හරසර මල් පොකුරු ඇදුරිඳු හිසට නැමේ

පුරවර දකුණු ලක විදුහල මහින්දේ
සිසුවර වියේ සිප්සතකුරු ඇහින්දේ
තවදුර උගෙන කැලණිය සරසවින්දේ
හරබර බහට දෙතෙරම රට සවන්දේ

තුන් සිත එකමුතුව දුරදිග දුටුව ඇස
චින් තන ගැඹර ගුණ නුවණින් පිරුණු හිස
අන් රසඳුනක් ලොව නැති බව කවිය මිස
රන් සටහනකි ඔබ නිගමන නියත ලෙස

අතැතිව යමක් නැණ සවියෙන් දිනා රට
සුබැසිව මත ගැටුම් නතු කළ විචාරෙට
සසැඳුව අරුත් පෙර'පර දිග රටාවට
ළබැඳිව නැඹුරු වියතෙකි කෙටි කතාවට

නැවෙන නැවුම් සිතුවිලි පින් සිසු දිවිය
පිදෙන කලාකෙත සරුදුටු සරසවිය
ජීවන සුවඳ-වෙස්සන්තර නවකවිය
සීහෙන විමැසුම්ය ගැලපුම් රස කවිය

කවි සරණිය-තිසර සරසවි කැලණි කවි
සිව් දිග පසිදු සැකසුම් ඉගෙනුමට සවි
තිව් කිවි දෙපස මග ඇදුරිඳු නතර නොවි
ගව් ගණනක දුරකි ලියැවෙන පෙරට යැවි

දැනුමට මුල පුරන සරසවි ගමන් බැස
ඉහපිට බරට ගෙන කළයුතු තමන් කිස
දෙපසට ගැලපීම හෙළ බස-ජපන් බස
අකුරට දැන ගැනුම කොතැන ද ඔබෙන් මිස

සුදැනුම ජපන් හෙළ දෙබසේ මහාඋස
ගැලපුම හරබරැති නිපුණැ'ති මනා ලෙස
විහිදුම කිතු කදඹ අතරෙන් දිසා දස
හෙළබිම වීදි නෝ නාටක කලා රස

දිවි මඟ ඇසුරු ඇදුරිඳු කුලතිලක සෙට
පිවි තුරු සුගුණ සලකුණ සිසු සිරස සිට
කිවි දින දවස කවි පිටුවේ ඇසුර සිට
කවි මං ගමන තුළ ඉටු දෙවි කෙනෙකි මට

කළ පොත-පතට සම්මානිත කිරුළ බැඳ
හෙළ මහ ඇදුරිඳුනි ලිවිසැර අඹර සඳ
දළ සිඳු නොනැඟ දිවි ගං දියපතර බිඳ
පෙළ පියගැටිති එසැවේවා ඉසුරු විඳ

# 51

# NOH DRAMA IS THE GREAT VEHICLE FOR SPREADING THE VARIOUS RELIGIOUS MATTERS IN THE MEDIEVAL JAPAN

*Chair - Senior Professor Kulatilaka Kumarasinghe*

In Japan, one of the most ancient forms of theatre is called Noh alias Nohgaku which is the oldest surviving form of Japanese Theatre.[1] It includes music, dance and acting to communicate Buddhist messages.[2] This classical lyric drama was created during the latter half of the Kamakura period (1185-1333) and the early part of the Muromachi period (1336-1573).[3,4]

Noh (literally, skill and ability) draws its material from many sources and its form from ritual and folk dances. It is essentially a poetic, quasi-religious musical drama, usually without dramatic conflict. A Noh drama portrays one all encompassing emotion dominating the main character, the shite whether jealousy, sorrow, hatred, or compassion, all music, gesture, dance and recitation are used to build the emotion to its final climax at the close of the play.[5]

Aside from the main character, there are one or sometimes two secondary parts, the *waki,* usually they are priests attired in long dark robes.[6] Like the audience, the *waki* is really there only to observe the tragedy enacted by the main character, *shite*. Usually a play starts with the priest or other secondary characters entrance. He explains the scene that he wants the audience to imagine.[7] The scenes are all actual spots in Japan.[8] The main character may then enter disguised as a local person. He reveals to the secondary character the significance of the site. He returns dressed as his true self with a mask and robes. From the time of his return to the stage, the *waki* generally remains seated to one side.

The first basic division of types of Noh plots is found in those which are set in the real world, and those that involve some forms of supernatural being. The real world plots can include plays where long – separate parents and children or brothers and sisters finally get to meet; the meeting brought about or aided by a priest or even a deity. Therefore Noh plays can be divided into two main types; Phantasmal Noh or *Mugen* Noh, Phenomenal Noh or *Genzai* Noh. Most of the plays are of the second type.[10]